**අන්තර්ජාලය හරහා ඔබගේ තේරීම් ලිපිය බාගත කර ගැනීමට හා අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා යොමුවීමට උපදෙස්**

**2025/2026 අධ්‍යයන වර්ෂය**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට (www.ugc.ac.lk) පිවිසෙන්න.
2. දැනටමත් ඔබ තේරීම් ලිපිය, උපලේඛනය දැක්වෙන ඇමුණුම් අංක 1 සහ අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 බාගත කරගෙන ඇති නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "University Registrations 2025/2026" කොටුවෙහි ඇති "To directly proceed to registration" දිගුව "click" කරන්න.
3. ඔබ තේරීම් ලිපිය සහ/හෝ ඉහත අනෙකුත් ලියකියවිලි බාගත කරගෙන නොමැති නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "University Registrations 2025/2026" කොටුවෙහි ඇති "To download the Letter of Selection & proceed to registration" දිගුව "click" කරන්න.

**ඔබ "To directly proceed to registration" දිගුව භාවිත කලේ නම්;**

1. දැනටමත් ඔබ බාගත කරගෙන ඇති අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 හි ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.

**ඔබ "To download the Letter of Selection & proceed to registration" දිගුව භාවිත කලේ නම්;**

1. ඔබට "Login" පිටුව දිස් වනු ඇත.
   - i. මෙහි ඔබ විසින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමට සාදාගත් ගිණුමෙහි පරිශීලක අංකය (User ID) සහ මුරපදය (Password) යොදන්න. ඔබගේ පරිශීලක අංකය වන්නේ ඔබ විසින් ගිණුම සෑදීමට යොදාගත් ඊමේල් ලිපිනයයි. ඔබට මුරපදය අමතක වී ඇති නම් "Forgot Password" දිගුව භාවිත කර මුරපදය වෙනස් කරගත හැකිය.
   - ii. දැන් "Login" බොත්තම ඔබන්න.
2. දැන් ඔබට "Verify Your Identity" පිටුව දිස්වනු ඇත.
   - i. මෙහි "Your NIC" කොටුවෙහි ඔබ විසින් අන්තර්ජාල විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඇතුළත් කරන ලද ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකයෙහි මුල් ඉලක්කම් කිහිපය දිස්වනු ඇත. එහි ඉතිරි ඉලක්කම් සහ තිබේ නම් ඉංග්‍රීසි අකුර සම්පූර්ණ කරන්න. (ඔබ විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ජාතික හැඳුනුම්පත් අංකයක් ඇතුළත් නොකරන ලද්දේ නම්, ජාතික හැඳුනුම්පත් අංකයෙහි ඉතිරි ඉලක්කම් සහ ඉංග්‍රීසි අකුර සම්පූර්ණ කිරීමේ මෙම කොටස ඔබට දිස් නොවනු ඇත).
   - ii. "Your Mobile Number" කොටුවෙහි ඔබ විසින් අන්තර්ජාල විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඇතුළත් කරන ලද ඔබගේ ජංගම දුරකතන අංකයෙහි මුල් ඉලක්කම් හය දිස්වනු ඇත. එහි ඉතිරි ඉලක්කම් හතර සම්පූර්ණ කරන්න.
   - iii. "Your Email Address"කොටුවෙහි, ඔබ විසින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමට සාදාගත් ගිණුම සෑදීමට යොදාගත් ඊමේල් ලිපිනය දැක්වෙනු ඇත.

සැළකිය යුතුය: **යම් හෙයකින්, ඔබගේ ඉහත සඳහන් ජංගම දුරකතනය හෝ ඊමේල් ගිණුම මේ වනවිට භාවිතයේ නොමැති/අක්‍රීය නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියෙහි සඳහන්ව ඇති දුරකතන අංක හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය අමතන්න.**

   - iv. දැන්, "Submit"බොත්තම ඔබන්න.
3. දැන් ඔබට "OTP Verification" පිටුව දිස්වනු ඇත. ඒ හා සමගම "Please click on the link sent to your email.Once you click on the link, an OTP will be sent to your mobile number" යන පණිවිඩය ද පිටුවේ දකුණු පසින් දිස්වනු ඇත.
4. එම පණිවිඩයේ සඳහන් පරිදි ඔබගේ ඊමේල් ගිණුමට යොමු කරන ලද දිගුව "click" කිරීම සඳහා ඉහත 2(iii) හි දැක්වූන ඊමේල් ගිණුමට ඇතුලු (log) වන්න.
5. එම ඊමේල් ගිණුමෙහි "Inbox" වෙත විශ්වවිද්‍යාල ප්‍රවේශ දෙපාර්තමේන්තුවෙන් යොමු කර ඇති ඊමේල් පණිවිඩය දැන් ඔබට දිස් වනු ඇත. එහි "Please click here to generate otp" යන දිගුව "click" කරන්න.
6. එම දිගුව "click" කළ පසුව ඔබ විසින් ඉහත 2(ii) හි සම්පූර්ණ කරන ලද ජංගම දුරකතන අංකයට OTP කේතයක් යොමු කෙරෙනු ඇත. එම OTP කේතය ඉහත 3 හි සඳහන් "OTP Verification" පිටුවෙහි ඇති "SMS Code"කොටුවට ඇතුළත් කර "Submit"බොත්තම ඔබන්න.
7. දැන් ඔබට "Selection Letters" පිටුව දිස්වනු ඇත.
8. "Selection Letters" පිටුවෙහි දැනට ලියාපදිංචිය සඳහා විවෘතව ඇති ඔබ තේරී පත්වූ පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට අදාළ තොරතුරු, එම තේරී පත්වීමට අදාළ තේරීම් ලිපිය සහ එම තේරී පත්වීමට සහ ලියාපදිංචියට අදාළ අනෙකුත් ලියකියවිලි තනි ගොනුවක් (file) සේ බාගත කරගත හැකි දිගුව දිස් වනු ඇත. එම දිගුව භාවිත කරමින්, අදාළ තේරීම් ලිපිය සහ අදාළ අනෙකුත් ලියකියවිලි බාගත කරගන්න.

සැළකිය යුතුය: **යම් හෙයකින්, ඔබ තේරීම් ලිපිය ඇතුලු අනෙකුත් ලියකියවිලි බාගත කිරීමට පෙර පද්ධතියෙන් ඉවත් වුවහොත් (log out) ඒවා බාගත කරගැනීම සඳහා ඉහත 7 හි සඳහන් "Selection Letters" පිටුවට නැවත පිවිසීමට පෙර ඉහත 1 සිට 6 දක්වා වූ පියවර නැවත අනුගමනය කිරීමට සිදුවන බව සලකන්න.**

**ඒ වෙනුවට, ඔබ එම තේරීම් ලිපිය ඇතුළු අනෙකුත් ලියකියවිලි බාගත කරගෙන පසුව ලියාපදිංචිය සම්පූර්ණ කිරීමේ අදහසින් පද්ධතියෙන් ඉවත් වුවහොත් ඉහත 1 සිට 6 දක්වා වූ පියවර නැවත අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "University Registrations 2025/2026" කොටුවෙහි ඇති "To directly proceed to registration" දිගුව භාවිතයෙන් අන්තර්ජාලය හරහා ලියාපදිංචි වීමේ පද්ධතියට කෙලින්ම යොමු විය හැකි බව සලකන්න.**

9. දැන්, තේරීම් ලිපියෙහි සහ බාගත කරගත් අනෙකුත් ලියකියවිලිවල සඳහන් තොරතුරු සහ උපදෙස් හොඳින් කියවන්න.
10. දැන් තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමට "Selection Letters" පිටුවෙහි ඇති "Click here to go to the Registration System" බොත්තම ඔබන්න.
11. දැන් ඔබ ඉහත 8 හි බාගත කරගත් අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 හි සඳහන් උපදෙස් අනුගමනය කරමින් අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිය සම්පූර්ණ කරන්න.